සමූපකාර සේවක කොමිෂන් සභාව (දකුණු පළාත)
கூட்டுறவு ஊழியர் ஆணைக்குழு (தென் மாகாணம்)
Co-operative Employees Commission (Southern Province)
සැලසුම් ලේකම් කාර්යාලයීය ගොඩනැගිල්ල (1 වන මහල), එස්. එච්. දහනායක මාවත, ගාල්ල.
திட்டமிடல் செயலாளர் அலுவலக் கட்டிடம் (1ம் மாடி), எஸ்.எச். தஹநாயக மாவத்தை, காலி.
Planning Secretariat Building (1 st Floor), S. H. Dahanayaka Mawatha, Galle.

| මගේ අංකය / எனது இல / My No. | SP/CEC/01/01/05 | ඔබේ අංකය / உனது இல / Your No. | | දිනය / திகதி / Date | 2025.02. 10 |
|---|---|---|---|---|---|

චක්‍රලේඛ අංක 02/2022 (vi)

දකුණු පළාතේ සියලුම සමූපකාර සමිති සභාපතිවරුන් වෙත,

**<u>බඳවාගැනීමේ සුදුසුකම් සංශෝධනය කිරීම - අභ්‍යන්තර විගණක (සමිති/ග්‍රාමීය බැංකු)</u>**

02/2022 චක්‍රලේඛයේ,පිටු අංක 24 හි සඳහන් EL – 03 අභ්‍යන්තර විගණක (සමිති/ග්‍රාමීය බැංකු) තනතුර සඳහා වූ බඳවා ගැනීමේ සුදුසුකම් අතරට සේවා පළපුරුද්ද යටතේ කලාප කළමනාකරු තනතුරේ සේවා කාලයද ඇතුළත් කර පහත පරිදි සංශෝධනය වන බව 2025.01.26 කොමිෂන් සභා නියෝගය පරිදි දන්වමි.

02.දකුණු පළාත තුළ සමූපකාර සමිතිවල කලාප කළමනාකරු තනතුරේ සේවයේ නියුතු සමූපකාර සේවකයන්ට සහන සැලසීම සඳහා මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

| | |
|---|---|
| තනතුර | අභ්‍යන්තර විගණක(සමිති/ග්‍රාමීය බැංකු) |
| කේත අංකය | EL – 03 |
| ශ්‍රේණිය | 111 ශ්‍රේණිය |
| වයස් සීමාව | අවුරුදු 18 ත් 45 ත් අතර |
| සුදුසුකම් | විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් වාණිජ්‍ය ,කළමනාකරණ,ගණකාධිකරණ,ආර්ථික විද්‍යා යන ක්ෂේත්‍රයට අදාළ උපාධියක් ලබා තිබීම සහ පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රය පිළිබඳ වසර 01 කට නොඅඩු පළපුරුද්ද/ පුහුණුව ලබා තිබීම හෝ |

ලේකම් / செயலாளர் / Secretary 091-2232794 | පරිපාලන නිලධාරී / நிர்வாக அதிகாரி / Administrative Officer 091-2234279 | කාර්යාලය/ෆැක්ස් / அலுவலகம்/பெக்ஸ் / Office/ Fax 091-2234383 | වෙබ් අඩවිය / இணையத்தளம் / Web Site www.cec.sp.gov.lk | විද්‍යුත් තැපැල / மின்னஞ்சல் / E-mail empcommicoopsp@sltnet.lk

| | |
|---|---|
| | ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ හෝ වෙනත් යම් පොදු රාජ්‍ය මාණ්ඩලීය රටක වරලත් ගණකාධිකාරී ආයතනයක ආවසරික II හෝ අන්තර් මාධ්‍ය පරීක්ෂණය හෝ ගිණුම්කරණය හා ව්‍යාපාරික සහතිකය II<br>හෝ ව්‍යාපාර අදියර විභාගය හෝ ඊට ඉහළ පරීක්ෂණයකින් සමත්වීම සහ පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රය පිළිබඳ වසර 01 කට නොඅඩු පළපුරුද්ද/ පුහුණුව ලබා තිබීම හෝ |
| | SUL මට්ටමේ II ශ්‍රේණියේ සහකාර ගණකාධිකාරී/ සහකාර අභ්‍යන්තර විගණක/ සහකාර බැංකු සේවා/ කලාප කළමනාකරු තනතුරක වසර 02 ක සේවා පළපුරුද්දක් ලබා තිබීම. විගණනය/ ගිණුම්කරණය/ මූල්‍ය කළමනාකරණය/ බැංකුකරණය පිළිබඳ වසර 01 කට නොඅඩු ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා තිබීම හෝ |
| | OPL – 1 මට්ටමේ I ශ්‍රේණියේ බැංකු/ ගිණුම්/ මූල්‍ය/ අලෙවි ක්ෂේත්‍රයේ තනතුරක සේවය කිරිම සහ විගණනය/ ගිණුම්කරණය/ මූල්‍ය කළමනාකරණය/ බැංකුකරණය පිළිබඳ වසර 01 කට නොඅඩු ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා තිබීම. |
| II ශ්‍රේණිය | III ශ්‍රේණියේ අභ්‍යන්තර විගණක තනතුරේ වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිම. |
| I ශ්‍රේණිය | II ශ්‍රේණියේ අභ්‍යන්තර විගණක තනතුරේ වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිම. |

03. මෙම චක්‍රලේඛ විධිවිධාන 2022.05.01 දින සිට බලාත්මක වේ.

කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

ජයන්ත ජී. ලියනගේ.

ලේකම්,

සමූපකාර සේවක කොමිෂන් සභාව,

දකුණු පළාත.

පිටපත් - 01. ප්‍රධාන ලේකම් දකුණු පළාත.

02. ලේකම්, කෘෂිකර්ම,ගොවිජන සංවර්ධන .... සමූපකාර අමාත්‍යාංශය - දැ.ගැ.ස

03. සමූපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර්, දකුණු පළාත - කරු.සමූ.සං.ප්‍රා.නි. හරහා අදාල සමිති දැනුවත් කිරීම සඳහා

04. දකුණු පළාත් සමූපකාර සේවක කොමිෂන් සභා චක්‍රලේඛ ගොනුවට.

# සමූපකාර සේවක කොමිෂන් සභාව (දකුණු පළාත)
## கூட்டுறவு ஊழியர் ஆணைக்குழு (தென் மாகாணம்)
## Co-operative Employees Commission (Southern Province)

සැලසුම් ලේකම් කාර්යාලයීය ගොඩනැගිල්ල (1 වන මහල), එස්. එච්. දහනායක මාවත, ගාල්ල.
திட்டமிடல் செயலாளர் அலுவலக் கட்டிடம் (1ம் மாடி), எஸ்.எச், தஹநாயக மாவத்தை, காலி.
**Planning Secretariat Building (1 st Floor), S. H. Dahanayaka Mawatha, Galle.**


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No. | SP/CEC/01/03/04 | ඔබේ අංකය<br>உனது இல<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2025.02.10 |

සමූපකාර සංවර්ධන කොමසාරිස්,

සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව,

දකුණු පළාත.

<u>**සමූපකාර සේවක කොමිෂන් සභා 02/2022 චක්‍රලේඛය අනුව සමූපකාර සේවකයින් ස්ථිර කිරීම සම්බන්ධවයි.**</u>

ඉහත කාරණයට අදාළව ඔබේ අංක දපස/සමූ.සං/සං/2/19 පුහුණු සහ 2024.12.24 දිනැති ලිපිය හා බැඳේ.

02) එම ලිපිය මගින් ඔබ විසින් සඳහන් කර ඇති පරිදි,දකුණු පළාත තුළ අන්තර්ග්‍රහණය කිරීම සඳහා නියමිත සුදුසුකම් සපුරා නොමැති සේවකයන්හට(SUL,OPL,MSL) පවත්වනු ලබන කෙටිකාලීන පුහුණු පාඨමාලාව සඳහා 2024.10.03 දින පවත්වන ලද සම්මුඛ පරීක්ෂණය මගින් තෝරාගත් සේවකයන් පිළබඳ විස්තර ඇතුළත් ලිපිය 2025.02.07 කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලදි.

03) මෙ සම්බන්ධයෙන් සම්මුඛ පරීක්ෂණයේ දී සලකා බලන ලද කොන්දේසිවල සඳහන් , 02/2022 චක්‍රලේඛය හඳුන්වා දී මේ වන විට කාලය වසර 02 ක් ඉකුත් වී ඇති බැවින් ,(ඔබ විසින් සඳහන් කර ඇති පරිදි)මෙම යෝජිත පුහුණු වැඩසටහනට ඇතුළත් වීමේ සම්මුඛ පරීක්ෂණයට පදනම් කරගන්නා ඉතිරි සේවා කාලය වසර 14 ක් හෝ ඊට අඩු ලෙස සංශෝධනය කරන බව 2025.02.07 කොමිෂන් සභා නියෝගය පරිදි දන්වමි.

04) මෙම පාඨමාලාව ඉතා ඉක්මනින් ආරම්භ කිරීමට කටයුතු කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

ජයන්ත ජී. ලියනගේ
ලේකම් (වැ.බ.)
සමූපකාර සේවක කොමිෂන් සභාව
දකුණු පළාත

ජයන්ත ජී. ලියනගේ.

ලේකම්,

සමූපකාර සේවක කොමිෂන් සභාව,

දකුණු පළාත.


ලේකම් / செயலாளர் / Secretary 091-2232794
පරිපාලන නිලධාරි / நிர்வாக அதிகாரி / Administrative Officer 091-2234279
කාර්යාලය/ෆැක්ස් / அலுவலகம்/பெக்ஸ் / Office/ Fax 091-2234383
වෙබ් අඩවිය / இணையத்தளம் / Web Site www.cec.sp.gov.lk
විද්‍යුත් තැපැල / மின்னஞ்சல் / E-mail empcommicoopsp@sltnet.lk